# The concept of "*Chittaveethi*" analyzed in *Therāvāda Abhidhamma*

## ථේරවාද අභිධර්මයෙහි විග්‍රහවන චිත්තවීථි සංකල්පය

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

ථේරවාද අභිධර්මය තුළ ඉතා සියුම්ව සාකච්ඡා කරන්නා වූ සංකල්පයක් ලෙස චිත්තවීථි සංකල්පය දැක්වේ. මෙය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගැනීම සඳහා අභිධර්මාර්ථ ප්‍රදීපිකාවේ එන හැඳින්වීම දැක්වීම ඉතා වැදගත්ය.

''ලෝකව්‍යවහාර වශයෙන් මිනිසුන්ගේ ගමන් මාර්ගයට "වීථි" යයි කියනු ලැබේ. චිත්ත ප්‍රවෘත්ති ක්‍රමය ද, මේ ගමන් මාර්ගය වැනි හෙයින් "වීථි" යන නාමයෙන් ව්‍යවහාර වේ. තවද, ආවර්ජනාදී අනෙක චිත්ත පරිපාටිය කරණකොට ගෙන සිත් එකිනෙක ගැටීම යන අර්ථයෙන් ද, නොයෙක් ආකාර වූ චිත්ත පරිපාටිය සදොරෙහි හටගනියි යන අර්ථයෙන් ද, චිත්ත සන්තානයාගේ පැවතීම යන අර්ථයෙන් ද, වීථි නම් වේ. එබැවින් සදොරින් යම්කිසි එක් ද්වාරයකින් ගත් අරමුණක් එල්බගෙන අතරක් නැතිව පිළිවෙලින් උපදින යම් සිත් පෙළක් වේද, එයට චිත්ත වීථිය කියති.''

එසේම අභිධර්මාර්ථ සංග්‍රහය තුළ චිත්තවීථි ක්‍රියාවලිය "ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය" යන තනි වචනයෙන් ද යොදා ඇත. ''චිත්තවීථි'' යන්නෙහි "ඉන්ද්‍රිය අරමුණ" ආදිය නොගෙන "චිත්ත" යන්න පමණක් යොදා ඇත්තේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂ ක්‍රියාවලියේ දී ප්‍රධානම කාර්යය සිදුකරන්නේ සිත නිසාය. සිත නොමැතිව කිසිදු ඉන්ද්‍රියයක් ක්‍රියාත්මක නොවන අතර, ඉන්ද්‍රිය පහෙන් තොරව සිතට සිතුවිලි අරමුණු කොට මෙම ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂ ක්‍රියාවලිය සිදුකළ හැකිය. එබැවින් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂ ක්‍රියාවලියේ දී සිතම ප්‍රධාන වන බැවින් මෙම ක්‍රියාවලියට ''චිත්තවිථි'' යන නාමය යොදා ඇත. මීට අමතරව අභිධර්මාර්ථ සංග්‍රහදීපනී ටීකාව " චිත්තවීථි" යන්න නිර්වචනය කොට ඇත්තේ, ***''විථීසද්දො චිත්ත පරමපරාති අත්‍ථෙ අනිප්පන්න පාටිපදිකො''*** යනුවෙනි. එනම් ''වීථි'' යනු ආවර්ජනාදී චිත්තයන්ගේ අනාදිමත් චිත්ත පරපුර ප්‍රකාශ කෙරෙන අනිෂ්පන්න ප්‍රාතිපදික පදයකි. ***''විවිධෙන චිත්තසන්තානෙන ඨානි ගච්ඡති පවත්තතීති වීථි'***' යනුවෙන් ''කරණ, අධිකරණ, භාව'' යන සාධනත්‍රයෙහි 'වි' පූර්ව 'ඨා' ගතිම්හි යන්නෙන් පරව 'ඉ' ප්‍රත්‍ය යොදා විථි යන්න නිපදවිය යුතුය. ***''විවිධා චිත්තපරම්පරා ඨාති පවත්තති එත්ථාතිවා වීථි''*** යනුවෙන් ''ආවර්ජනාදී අනේප්‍රකාර චිත්තපටිපාටිය කරනකොටගෙන එකිනෙකට හටගැනීම වීථි නම් වේ.'' ***''විවිධස්ස චිත්තසන්තානස්ස ඨානං පවත්තනං වා වීථි''*** යනුවෙන් අනේකවිධ චිත්තසන්තානයාගේ පැවැත්ම "වීථි" නම් වේ.[1] ප්‍රතිසන්ධි, භවඞග චිත්තයන් ද්වාර මුක්ත නිසා වීථිමුක්ත නමින් හැඳින්වේ.

---

[1] සංඝානන්ද හිමි, වෙන්නප්පුවේ, 1934, වීථිමධුව නම් අභිධර්ම නාමරූප වීථි විස්තරය, ජිනාලංකාර යන්ත්‍රණාලය, කොළඹ, හුණුපිටිය, පි. 1.

ආභිධම්මික චිත්තවීථි සංකල්පය යනු පුද්ගලයාගේ සිතිවිලි පරම්පරාව සූත්‍රාගත විග්‍රහයන්ට වඩා පුළුල් ලෙස ඉදිරිපත් කිරීමකි. ඒ බව මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ මහතා මෙසේ දක්වයි.

''චිත්තවීථි යනුවෙන් විග්‍රහ වන්නේ අන් කිසිවක් නොව ඉහත දක්වන ලද පරිදි සූත්‍රාගත ඉන්‍ද්‍රිය ප්‍රත්‍යක්ෂය සිදුවීමේදී දක්වා ඇති චක්ඛු, විඤ්ඤාණ, වේදනා, සඤ්ඤා, විතක්ක, සංඛාර විඤ්ඤාණ පහළවීමේ ක්‍රියාදාමය යි. අභිධර්මයේ දී එම සංක්ෂිප්ත ක්‍රියාවලිය සවිස්තරව ඉදිරිපත් කිරීමක් සිදු වී ඇත. තවද එම විස්තරාත්මක විග්‍රහය වඩාත් සංවිධාත්මකව දැක්වීමක් ද අභිධර්මයේ දී දැකගත හැකිය.''[2]

මේ අනුව පැහැදිලි වන්නේ චිත්තවීථි සංකල්පය බිහිවන්නේ පුද්ගලයාගේ චිත්ත සන්තාන සිතිවිලි පරම්පරාව ක්‍රමානුකූලී විග්‍රහයකට නතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බවයි.

ආභිධම්මික චිත්තවීථි සංකල්පය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එනම් "වීථි" සහ "වීථි මුක්ත" යනුවෙනි. මෙයින් "වීථි" යටතේ සිදුවන පුද්ගලයාගේ චක්ෂුරාදී ඉන්‍ද්‍රියන්ට ගොදුරු වන රූපාදී ආරම්මණයන් තුළින් ඇතිවන චිත්තවීථි "පඤ්චද්වාරවීථි" යනුවෙන් ද, කායික සම්බන්ධයක් නොමැතිව මනස හා සිතිවිලි පමණක් සම්බන්ධ වීම තුළින් සිදුවන චිත්ත ක්‍රියාවලිය "මනොද්වාරවීථි" යනුවෙන් ද හැඳින්වේ. ඉහත වර්ගීකරණයේ දෙවැන්න වීථිමුක්ත යනුවෙන් හැඳින්වෙන්නේ කම්ම, කම්මනිමිත්ත, ගතිනිමිත්ත යන පූර්ව කර්මයක් අරමුණුකොට භවයක ප්‍රතිසන්ධිය ලබන නිසා එය චිත්තවීථි ක්‍රියාත්මක වන ආකාරයෙන් සිදුනොවන බැවිනි.[3] අභිධර්මාර්ථ සංග්‍රහය මෙහි දී අවශ්‍යයෙන් ම සඳහන් කරන්නේ කාමලෝකයෙහි උපත ලැබුවද අඳ, ගොළු, බිහිරි පුද්ගලයන්ට ඒ ඒ ඉන්‍ද්‍රියයන්ට සම්බන්ධ චිත්ත වීථි ක්‍රියාත්මක නොවන බවයි. එසේ ම අසඤ්ඤී තලයෙහි වාසය කරන සත්‍වයන්ට ද, නිරෝධ සමාපත්තියට සමවැදුණු උතුමන්ලාගේ ද සඤ්ඤා නිරුද්ධව පවතින බැවින් චිත්තවීථි ක්‍රියාත්මක නොවන අතර, අසඤ්ඤ තලයෙන් නික්මී කාමාවචර භූමියක ප්‍රතිසන්ධිය ලැබීමෙන් පසුව ද, නිරෝධ සමාපත්තියෙන් නැගීසිටි පසුවද චිත්තවීථි ක්‍රියාත්මක වන ආකාරය විසුද්ධි මාර්ගයේ පටන් පසුකාලීන අභිධර්ම අට්ඨකථාවල ද සවිස්තරව විග්‍රහ වේ.

පඤ්චද්වාරාවජ්ජන චිත්තය ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය කරන කරුණු හතරක් අභිධම්මත්ථ සංග්‍රහය දක්වා ඇත. එනම්. චක්ෂුරාදී සජීවී ඉන්‍ද්‍රියන් පැවතීම, රූපාදී ආරම්මණයන් තිබීම, ඇසට ආලෝකය, කනට ආකාශය, නාසයට වායෝ ධාතුව, දිවට ආපෝ ධාතුව, කයට පඨවි ධාතුව සහ සිතට භවඞ්ග චිත්තය සහ මනසිකාරය යන කරුණු හතර යි. එසේම පඤ්චද්වාර චිත්තවීථි ප්‍රධාන කොටස් හතරකට බෙදා දක්වා ඇත. එනම්,

[2] ගල්මංගොඩ, සුමනපාල, 2012, ආභිධම්මික චිත්තවීථි සංකල්පය. නිවන්මග චිත්ත විභාගය. හතලිස් තුන්වන කලාපය, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය, පි. 76.

[3] වීථිමුත්තානං පන කම්ම කම්මනිමිත්ත ගතිනිමිත්ත වසෙන තිවිධා හොති විසයප්පවත්ති

අභි. සං. පි. 58.

1. අතිමහත්ත - ඉතා පුළුල්
2. මහත්ත - පුළුල්
3. අතිපරිත්ත - ඉතා කුඩා
4. පරිත්ත - කුඩා[4]

යනුවෙනි. මනෝද්වාර චිත්තවීථි ද කොටස් 02ක් යටතේ දක්වා ඇත.

1. විභූත - පැහැදිලි
2. අවිභූත - අපැහැදිලි

මෙහ දී චිත්තවීථි වලට අදාළව ද්‍රව්‍යයක හා මනසෙහි පවත්නා කාලසීමාව හෙවත් ක්‍ෂණ ප්‍රමාණය පිළිබඳ අවබෝධයක් ලබාගත යුතු වේ. මූලික බුද්ධ දේශනාවන් ද පදනම් කොටගනිමින් ථෙරවාද අභිධර්මයන් තුළ දක්වා ඇත්තේ එක් චිත්තයක් හා රූපයක් එක් ක්‍ෂණයක් තුළ පවතීය යන්න යි. ***"සංඛාරා ඛණභංගුරා"*** වැනි දේශනාවල මේ අදහස දැකගත හැකි වේ. එහෙත් මෙම එක් ක්‍ෂණයක් තුළ අනුක්‍ෂණ තුනක් අන්තර්ගත ය. එනම්,

1. උප්පාදක්ඛණා - හටගැනීමේ ක්‍ෂණය
2. ඨීතික්ඛණා - පැවතීමේ ක්‍ෂණය
3. භංගක්ඛණා - විනාශවීමේ ක්‍ෂණය[5]

සිත හා රූපය යන දෙකටම මෙම ක්‍ෂණ අතුරින් උප්පාද හා භංග යන ක්‍ෂණවල කාලය එක හා සමාන ය. නමුත් ඨීති ක්‍ෂණය සිතටත්, රූපයටත් එක හා සමාන නොවේ. රූපයක හෙවත් ද්‍රව්‍යයක ඨීති ක්‍ෂණය හෙවත් පැවැත්මේ කාලය මනසේ පැවත්මට අදාළ අනුක්‍ෂණ හතළිස් නවයකට (49) සමාන ය. මෙය ගණනය කොට ඇත්තේ පහත සඳහන් පරිදි ය.

ක්‍ෂණ වශයෙන් ගත්කල රූපයක පැවැත්ම චිත්තක්ෂණ දාහතකට (17) සමාන ය. එනම් රූපයක් හටගෙන (උප්පාද), පැවති (ඨීති), නැතිව යන (භංග) කාලය තුළ සිත දාහත් වරක් (17) ඇතිව පැවතී නැතිව යයි.[6] එක් චිත්තක්‍ෂණයකට අනුක්‍ෂණ තුනක් බැගින් ගත්විට, චිත්තක්ෂණ දාහතකට (17) අනුක්‍ෂණ පනස් එකක් (51) ලැබේ. මින් අදහස් වන්නේ රූපයක් හටගෙන පැවතී නැතිව යන

---

[4] අතිමහන්තං, මහන්තං, පරිත්තං, අතිපරිත්තංචෙති පඤ්චද්වාරෙ, මනොද්වාරෙ පන, විභූතං, අවිභූතංචෙති ඡධාවිසයප්පවත්ති වෙදිතබ්බා.
Chatta Sangayana CD Rom, Vipassana Research Institute Dhammagiri, Igatpuri,422 - 403 Disk, Nashik, India

[5] කථං උප්පාදට්ඨිතිභඞ්ග වසෙන ඛණත්තයං එකචිත්තක්ඛණං නාම.
Chatta Sangayana CD Rom, Vipassana Research Institute Dhammagiri, Igatpuri,422 - 403 Disk, Nashik, India

[6] අභිධම්මත්ථසංගහ, පිටු. 156-159.

කාලසීමාව තුළ සිත ක්‍ෂණ වශයෙන් දාහතක් (17) හෝ අනුක්‍ෂණ වශයෙන් අනුක්‍ෂණ පනස් එක් (51) වරක් ක්‍රියාත්මක වන බවයි.

මේ අනුව සිත හා රූපයේ උප්පාද හා භංග කාලය, කාල වශයෙන් සමාන බැවින් ඒ ක්‍ෂණ දෙක අත්හළ විට (51-.2 = 49) සිතෙහි අනුක්‍ෂණ හතලිස් නවයක් (49) ලැබේ. මෙසේ රූපයේ ඨිති ක්‍ෂණය සිතෙහි අනුක්‍ෂණ හතලිස් නවයකට (49) සමාන ය. මෙම අනුක්‍ෂණ හතලිස් නවය (49) තුළ චිත්ත වීථි ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව පැහැදිලි අදහසක් අභිධම්මාර්ථ සංග්‍රහ සන්නයෙහි දක්නට ලැබේ. එම කෘතියේ හතරවන පරිච්ඡේදය වෙන් වී ඇත්තේ අභිධර්මාර්ථසංග්‍රහයේ එන චිත්තවීථි විග්‍රහ කිරීමට ය. පොදුවේ ගෙන කෙරෙන එම විග්‍රහය චිත්තක්‍ෂණ දාහත (17) ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ මනා වැටහීම උපකාරී වේ.

''එක් පුරුෂයෙකු එල හටගත් අඹ ගසක් මුල සිට පොරවාගෙන සයනයක යෙදී ඇත. ඒ අසලින් අඹ ගසෙන් වැටෙන අඹ ගෙඩියක ශබ්දයෙන් නින්දෙන් ඇහැරී, පොරවා සිටි වස්ත්‍රය වෙන්කොට ඇස දල්වා බලනවිට ඒ ඉදුණු අඹගෙඩියක් බව දැන අතින් ගෙන සිඹිමින් සුවඳ බලා එය මැනවින් ඉදුණු බව දැන අනුභව කරයි. මුව දෙපැත්තෙන් වැගිරෙන පැණි සහිත අඹ යූෂය ද අනුභව කොට නැවත නින්දට යන්නේ ය.''

මෙය විග්‍රහ කරමින් දක්වන්නේ මෙසේ ය. එහි පුරුෂයා නිදන කාලය තම සිත භවඞග ගත වී ඇති කාලය යි. අඹ ගෙඩිය බිම පතිත වීම නම් චක්‍ෂුරාදී ඉන්ද්‍රියයන් රූපාදී ආරම්මණවල ගැටුණු පසු භවඞගය චලනය වූ අවස්ථාවයි. මිනිසා ඒ ශබ්දයෙන් ඇහැරීම යනු පඤ්චද්වාරාවජ්ජනය යි. නින්දෙන් පිබිදී සෝදිසි කොට බැලීම යනු චක්‍ෂුරාදී විඥානයේ ප්‍රවෘත්ති කාලය යි. එම අඹ ගෙඩිය දැක අතට ගැනීම යනු සම්පටිච්ඡනය යි. එහි සුවඳ බැලීම යනු සන්තීරණය යි. එය ඉදුණු බව තහවුරු කිරීම වොත්ථපනය යි. එය හොඳ ආහාරයකැයි සිතා අනුභව කිරීම යනු ජවන (7) යි. එය අනුභව කොට අවසානයේ මුව දෙපසින් වැගිරෙන පැණි සහිත අඹ යුෂ ද අනුභව කිරීම යනු තදාරම්මණ (2) යි. නැවත පොරවාගෙන නින්දට යෑම යනු භවඞගපාත වීම හෙවත් සිත නැවතත් භවඞගයට වැටීම යි. මෙම ක්‍රමයට ඉහත සඳහන් කරන ලද පඤ්චද්වාර චිත්තවීථියෙහි අතිමහන්තාරම්මණ චිත්තවීථි පිළිබඳ විමසීමේදී එය මෙසේ දැක්වේ.

- **අතිමහත්තාරම්මණ චිත්ත වීථිය**

චක්ඛු ප්‍රසාද වස්තුව, රූපාරම්මණය, ආලෝකය, මනසිකාරය යන ධර්ම සතර ඉතා බලවත් නම්, එක් චිත්තක්‍ෂණයක් හෙවත් අතීත භවඞ්ග සිතක් ගතවී, චිත්තක්‍ෂණ සොළොසක් (16) ඉදිරියට ඇති අතිමහත්තාරම්මණ චක්ඛුද්වාර චිත්ත වීථිය හටගන්නේ ය. එහි,

01, 02 සහ 03 වෙනි සිත්, භවඞ්ග කෘත්‍යය සිද්ධ කරන්නා වූ විපාක සංඛ්‍යාත භවඞ්ග සිත් ය. එහි අරමුණ පූර්ව භවයෙන් සඳොරින් ගත් කම්ම, කම්ම නිමිති, ගති නිමිති, යන ද්වාරවිමුක්ත අරමුණු වලින් එකෙකි. ඒ සිත් උපදින්නේ හදය වස්තු රූප ඇසුරු කොට ගෙන ය.

04 වෙනි පඤ්චද්වාරාවජ්ජන සිත, හදය වස්තු රූපය ඇසුරු කොට ගෙන උපදින නමුත්, චක්ඛුද්වාරයෙන් ගත් ප්‍රත්‍යුත්පන්න වර්ණායතනය නම් වූ රූපාරම්මණය අරමුණු කරයි. එය අහේතුක ක්‍රියා සිතකි.

05 වෙනි චක්ඛු විඤ්ඤාණ සිත, දස්සන කෘත්‍ය කරන්නා වූ කුසල් හෝ අකුසල් විපාක සිතකි. චක්ඛුප්‍රසාද වස්තුවෙහිදීම ප්‍රත්‍යුප්පන්න රූපාරම්මණයාගේ ස්පර්ශ වීමෙන් හටගන්නේ ය.

06 සිට 17 දක්වා ඇති ඉතිරි සිත් හදය වස්තු රූපය ඇසුරු කොටගෙන ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණය අරමුණු කොටගෙන උපදින්නාහු ය.

06 වෙනි සම්පටිච්ඡන සිත, සම්පටිච්ඡන කෘත්‍ය කරන්නා වූ අහේතුක විපාක සිතකි. 07 වෙනි සන්තීරණ සිත, සන්තීරණ කෘත්‍යය කරමින් උපදින අහේතුක විපාක සිතකි. 8 වෙනි වොත්ථපන සිත අහේතුක ක්‍රියා සිතක් වූ මනොද්වාරාවජ්ජන සිතම ය. මෙතැන්හි දී වොත්ථපන කෘත්‍ය සිද්ධ වන්නේ ය. 9 සිට 15 දක්වා ඇති ජවන් සිත, ජවන කෘත්‍ය සිද්ධ කරන්නා වූ කාමාවචර කුසලාකුසල ක්‍රියා ජවන් සිත් විසිනවයෙන් එකකි. 16 සහ 17 වෙනි සිත් දෙක, තදාලම්බන කෘත්‍ය සිදුකරන්නා වූ විපාක සික් එකොළොසින් එකකි. අනතුරුව භවඞ්ග සිත් ඇති වේ.මෙහි දක්වන ලද චක්ඛුද්වාරික අතිමහන්තාරම්මණ චිත්තවීථිය මෙන්ම, සොත, ඝාණ, ජිව්හා, කාය යන සතර ද්වාරයෙන් ද ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ යන ආරම්මණයන් එල්බගෙන අතිමහන්තාරම්මණ පඤ්චද්වාර චිත්තවීථි සතරක් ඇතිවන්නේ ය.[7]

- **මහන්තාරම්මණ චිත්ත වීථිය**

අතීත භවඞ්ග දෙකක් හෝ තුනක් ගත වී ඉදිරියට චිත්තක්ෂණ පසළොසක් (15) හෝ තුදුසක් (14) ඇති චිත්ත වීථි මහන්තාරම්මණ චිත්ත වීථි නම් වේ. එක් ද්වාරයකට මහන්තාරම්මණ චිත්ත වීථි දෙක බැගින් ද්වාර පසට මහන්තාරම්මණ චිතත් වීථි දසයක්ම ලැබෙන්නේ ය.

[7] එක චිත්තක්ඛණාතිතානිවා බහු චිත්තක්ඛණාතිතානිවා ඨිතිප්පත්තානෙව පඤ්චාරම්මණානි පඤ්චද්වාරෙ ආපාථමාගච්ඡන්ති යස්මා යදි එකචිත්තක්ඛණාතීතකං රූපාරම්මණං චක්ඛුස්ස ආපාථමාගච්ඡති. තතොද්වික්ඛත්තු භවඞ්ගෙ චලිතෙ භවඞ්ගසොතං වොච්ඡින්දිත්වා, තමෙව රූපාරම්මණං ආවජ්ජෙන්ති, පඤ්චද්වාරාවජ්ජන චිත්තං උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති, තතො තස්සාන්තරං තමෙව රූපං පස්සන්තං චක්ඛුවිඤ්ඤාණං, සම්පටිච්ඡන්තං, සම්පටිච්ඡන චිත්තං සන්තීරයමානං සන්තීරණ චිත්තං වවත්ථපෙන්තං වොත්ථපන චිත්තං චෙති යථාක්කමං උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති. තතොපරං එකූනතිංස කාමාවචරජවනෙසු යංකිඤ්චි ලද්ධප්පච්චයං යෙභුයොයන සත්තක්ඛත්තුං ජවති. ජවනාසු බන්ධා නිච ද්වෙ තදාරම්මණ පාකානි යථාරහං පවත්තන්ති. තතොපරං භවඞ්ගපාතො.
Chatta Sangayana CD Rom, Vipassana Research Institute Dhammagiri, Igatpuri,422 - 403 Disk, Nashik, India

- **පරිත්තාරම්මණ චිත්තවීථි**

වස්තු, ආරම්මණ, ආලෝක, මනසිකාරාදීන්ගේ දුර්වලතාවය අධිකනම්, භවඞ්ග චලනය වන්නට පෙර අතීත භවඞ්ග සතර සිට නවය දක්වා ගතවන චිත්ත වීථි පරිත්තාරම්මණ චිත්තවීථි නම් වේ.

- **අතිපරිත්තාරම්මණ චිත්ත වීථි**

වස්තු, ආරම්මණ, ආලෝක, මනසිකාරාදීන්ගේ දුර්වලතාවය ඉතාමත් අධික වී නම්, භවඞ්ග චලනය වන්නට පෙර අතීත භවඞ්ග සිත් දසය සිට පසළොස දක්වා ගතවීමට අවකාශ තිබේ. එසේ ඇති කල්හි, වොට්ඨපන සිත් දෙකක්වත් හටගැනීමට අවස්ථාවක් නොලදහොත්, වීථි සිත් හටනොගැනීම ධර්මතාවයකි. එබැවින් පඤ්චද්වාරාවජ්ජනය, චක්ඛුවිඤ්ඤාණය, සම්පටිච්ඡනය, සන්තීරණය ආදී වීථි සිත් නොලැබේ. භවඞ්ගුපච්ඡේදයක් නොලැබෙන්නේ නම් පඤ්චද්වාරවජ්ජනයක් නොවන්නේ ය. මේ චිත්ත වීථියෙහි ආරම්මණය භවඞ්ග චලනය කිරීමට හැකිවන්නේ, රූපය හටගෙන චිත්තක්ෂණය දසයක් හෝ වැඩි ගණනක් ගතවී ඉදිරියට චිත්තක්ෂණ සතක් හෝ අඩුගණනක් ඇති බැවින් රූපයාගේ නිරුද්ධයට ආසන්න අවස්ථාවෙහි දීය. මේ අරමුණට අතිපරිත්තාරම්මණය යයි ව්‍යවහාර වන්නේත් ඒ නිසාම ය.

- **මනෝද්වාර චිත්ත වීථි**

මනෝද්වාරයෙන් ගන්නා ලද ධම්මාරම්මණයක් එල්බගෙන පහළ වන්නා වූ චිත්ත සන්තතිය හෙවත් සිත්පෙළ මනෝද්වාරචිත්ත වීථි නම් වේ. ප්‍රත්‍යුත්පන්න වූද, අතීතවූ ද, අනාගතවූද, සියලු චිත්ත, චෛතසික, රූප හා කාලවිමුක්ත වූ නිර්වාණ, ප්‍රඥප්ති ධර්මයන් ද මනෝද්වාරයට හමු වේ. මනෝද්වාරය වනාහි සිතින්ම අරමුණු ගන්නා කල්හි, ඒ අරමුණු හා ස්පර්ශ වන භවඞ්ගුපච්ඡේද සිත ය.

මනෝද්වාරයෙහි හටගන්නා වූ චිත්තයන් ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණය අරමුණු කරණ කල්හි රූපාදීන්ගේ ප්‍රත්‍යුත්පන්න වූ සතළොස් චිත්තක්ෂණය පවත්නා වූ කල්හි මනෝදවාරයට හමු නොවෙත්. මුවහ කරන ලද්දා වූ අරමුණම ප්‍රත්‍යුප්පන්න වශයෙන් මනෝද්වාරයට හමුවෙත්. කලින් දක්නා ලද රූපාදිය නැවත අරමුණු කරනු කැමැති නම්, දිට්ඨ, සුත, මුත වශයෙන් ත්‍රිවිධාකාර වූ හෙවත් දක්නා ලද හෝ, අසන ලද හෝ අන් ආකාරයකින් වැදගන්නා ලද හෝ අරමුණ ම මනෝද්වාරයට ප්‍රත්‍යුත්පන්න ආරම්මණයක් වශයෙන් හසුවන බව දත යුතුයි. වත්මන් අරමුණට ආයුෂ චිත්තක්ෂණ සතළොසක් වන බැවින්, ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණයක් ගෙන හටගන්නා වූ මනෝද්වාරික චිත්තවීථීන්ට ද චිත්තක්ෂණ සතළොසක් ගතවන්නේ ය. එබැවින් ඒ චිත්ත වීථියෙහි අතීත භවඞ්ගයක් ද පහළවන්නේ ය.

අතීත රූප, අනාගත රූප, චිත්ත, චෛතසික, නිබ්බාණ පඤ්ඤත්ති යන මේ ආරම්මණයෝ චිත්තක්ෂණ ගණනක් දරා පවත්නා අරමුණු නොවෙති. එබැවින් එම අරමුණු මනෝද්වාරයට හමුවීමේ දී,

පඤ්චද්වාරයෙහි මෙන් ගතවන සිත් ගණන නියම නැත. එහෙයින් එකී අරමුණක් ගෙන උපදනා මනෝද්වාරාවීථින්හි අතීත භවඞ්ගයක් නැති බව දත යුතුය.

මනෝද්වාරයෙහි විෂය ප්‍රවෘත්ති දෙකෙකි. එනම් විභූතාරම්මණ සහ අවිභූතාරම්මණය යන දෙක ය. විභූතාරම්මණය නම් ප්‍රකට හෙවත් පැහැදිලි අරමුණ ය. අප්‍රකට වූ හෙවත් පැහැදිලි නොවූ අරමුණ අවිභූතාරම්මණය නම් වේ. එබැවින් මනෝද්වාරයට හමුවන සියලුම අරමුණු විභූත හෝ අවිභූත වන බව සැළකිය යුතුයි.

මනෝද්වාර චිත්ත වීථින්හි උපදනා ජවන වශයෙන් මනෝද්වාර වීථි දෙවැදෑරුම් වේ. එනම් කාමජවන වීථි සහ අර්පණා ජවන වීථි යන දෙක ය. එයින් කැමාවචර ජවන් සිත් උපදනා චිත්ත වීථි කාම ජවන වීථි නම් වේ. ධ්‍යාන මාර්ගඵල ජවන් සිත් උපදනා චිත්ත වීථි අර්පණා ජවන වීථි නම් වේ.